විභාග, විභාග ප්‍රතිඵල ආදිය

මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්‍ෂණික ආයතනය

ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන්
ඇතුළත්කර ගැනීම - 2021/2022

මොරටුව විශ්වවිද්‍යාලයට අයත් තාක්‍ෂණික ආයතනය මගින් පවත්වනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම පිණිස සුදුසුකම්ලත් අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව දිඩගම, හෝම්ගම පිහිටි මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්‍ෂණික ආයතනය තුළ පැවැත්වෙනු ඇත.

1. *සාමාන්‍ය* :

ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමා පාඨමාලාව දෑ අවුරුදු අධ්‍යයන හා එක් අවුරුදු ප්‍රායෝගික යන්ත්‍රාගාර පුහුණුවකින් ද සමන්විත වේ. පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. මෙම පාඨමාලාවේ දී පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් හැදෑරීමට අවස්ථාව ලැබේ. :-

(අ) නාවුක අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (*Set* 1)

(i) නාවුක ඉංජිනේරු තාක්‍ෂණය
(ii) නෞකා චලන අධ්‍යයන හා තාක්‍ෂණය

(ආ) අනිකුත් අධ්‍යයන ක්ෂේත්‍රයන් (*Set* 2)

(i) රසායන ඉංජිනේරු තාක්‍ෂණය
(ii) සිවිල් ඉංජිනේරු තාක්‍ෂණය
(iii) විදුලි ඉංජිනේරු තාක්‍ෂණය
(iv) ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්‍ෂණය
(v) තොරතුරු තාක්‍ෂණය
(vi) යාන්ත්‍රික ඉංජිනේරු තාක්‍ෂණය
(vii) පොලිමර් තාක්‍ෂණය
(viii) පේෂකර්ම හා ඇඟලුම් තාක්‍ෂණය

2. *යෝග්‍යතාවය* :

2.1 *වයස* :

(අ) 2020.12.31 වැනි දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 24 ට වැඩි නොවිය යුතු ය.

(ආ) නෞකා චලන අධ්‍යයන තාක්‍ෂණය හා නාවුක ඉංජිනේරු තාක්‍ෂණය යන පාඨමාලාවන් හැදෑරීමට අපේක්ෂා කයන් තෝරා ගැනීමේ දී 2020.12.31 වැනි දිනට වයස අවුරුදු 20ට අඩු අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ. එම පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමේ දී විශේෂ වෛද්‍ය පරීක්‍ෂණයකට හා සම්බුධ පරීක්‍ෂණයකට පෙනී සිට ඉන් සමත්විය යුතු වේ.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති ඕනෑම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් හා වෙනත් පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් මෙම පාඩමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

2.2 *අධ්‍යාපන සුදුසුකම්* :

(අ) 1. අයදුම්කරුවන් ශ්‍රී ලංකා විභාග කොමසාරිස් ජනරාල් විසින් 2018, 2019 හෝ 2020 වසරේ පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී එකවර පහත සඳහන් විෂයයන්ගෙන් 03 ක් සමත්විය යුතු ය :

(i) භෞතික විද්‍යාව
(ii) රසායන විද්‍යාව
(iii) සංයුක්ත ගණිතය
(iv) උසස් ගණිතය

(ආ) ''නෞකා චලන අධ්‍යයන තාක්‍ෂණය'' හා ''නාවුක ඉංජිනේරු තාක්‍ෂණය'' යන පාඩමාලාවන් සඳහා අයදුම් කිරීමට අපේක්ෂිත අයදුම්කරුවන් හට අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන (C) සාමාර්ථයක් තිබීම අනිවාර්යය වේ.

3. *තෝරාගැනීමේ පදනම/ක්‍රියාපරිපාටිය* :

3.1 *පාඩමාලාවට ඇතුළත් කරගැනීම* :

ශිෂ්‍යයන් තෝරාගැනීම අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ප්‍රතිඵල හා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්‍ෂණික ආයතනය මගින් පැවැත්වෙන යෝග්‍යතා පරීක්‍ෂණයේ සාමාර්ථය මත සිදුවේ.

යෝග්‍යතා පරීක්‍ෂණය සමත් වූ ශිෂ්‍යයන් අතරින් අ. පො. ස. (උ. පෙළ) විභාග ලකුණුවල කුසලතාවය මත (Z ලකුණු මත) සිසුන් තෝරාගනු ලැබේ. 40% ක් අ.පො.ස. (උ. පෙළ) විභාගයේ කුසලතාවය මත හා 60%ක් දිස්ත්‍රික් පදනම මත ශිෂ්‍යයන් තෝරාගැනීම සිදුවේ.

3.2 *අධ්‍යයන ක්ෂේත්‍රය* :

යෝග්‍යතා පරීක්‍ෂණයේ ලකුණු හා අයදුම්කරුගේ එක් එක් ක්ෂේත්‍රය සඳහා දක්වන කැමැත්තේ අනුපිළිවෙල, අධ්‍යයන ක්ෂේත්‍රය තෝරා ගැනීමේ දී සැළකිල්ලට භාජනය කරනු ලැබේ.

4. *අයදුම් කිරීමේ පිළිවෙල* :

4.1 *අයදුම්පත් පෝරම* :

(i) පහත සඳහන් අන්තර්ජාල වෙබ් අඩවියෙහි සඳහන් කර ඇති මාර්ගගත අයදුම්පත්‍රය (online application) හරහා අයදුම්කරුවන් පළමුව සිය අයදුම්පත මාර්ගගත ව ඉදිපත් කළ යුතුය.

http ://www.itum.mrt.ac.lk

(ii) මාර්ගගත අයදුම්පත්‍රය (online application) ඉදිපත් කිරීමෙන් පසු අයදුම්කරුවන් ස්වයංක්‍රීයව ජනනය වන මාර්ගගත අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපත බාගත කර ගත යුතුය.

(iii) බාගත කළ මුද්‍රිත පිටපතේ අන්තර්ගතය අයදුම්පතෙහි දක්වා ඇති පරිදි සහතික කළ යුතු අතර (අයදුම්පතේ 03 සහ 05 යන ඡේද බලන්න). අ. පො. ස. (උ.පෙළ) සහතිකවල සහතික කළ පිටපත් ද අයදුම්පතෙහි මුද්‍රිත පිටපත සමග එවිම අවශ්‍ය වේ.

(iv) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි මුද්‍රිත පිටපත බහාළන ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ ''ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමා පාඩමාලාව සඳහා ඇතුළත් වීම - 2021/2022'' යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

(v) මාර්ගගත අයදුම්පත්‍රය (online application) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර යොමු කළ යුතු අතරම අයදුම්පතෙහි මුද්‍රිත පිටපත ''සහකාර ලේඛකාධිකාරී, අධ්‍යයන හා ශිෂ්‍ය කටයුතු අංශය, මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්‍ෂණික ආයතනය, දියගම, හෝම්ගම'' යන ලිපිනයට අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර එවිය යුතුය.

(vi) තම ලිපිනය ලියන ලද රූ. 45 ක් වටිනා මුද්දර අලවන ලද 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද අයදුම්පත සමග එවිය යුතුය.

වැදගත් :

සෑම අයදුම්කරු වෙකුම නියමිත දිනට පෙර මාර්ගගත අයදුම්පත්‍රය (online application) අයදුම්පතෙහි මුද්‍රිත පිටපත යන දෙකම ඉදිපත් කළ යුතු බව කරුණාවෙන් සලකන්න. මාර්ගගත අයදුම්පත්‍රය (online application) සහ අයදුම්පතෙහි මුද්‍රිත පිටපත ඉදිපත් කිරීමට අපොහොසත් වූ අයදුම්කරුවන්ගේ අයදුම්පත් වැඩිදුර කටයුතු සඳහා සලකා බලනු නොලැබේ.

4.2 *අධ්‍යයන ක්ෂේත්‍රයන් තෝරා ගැනීම* :

(i) මෙම පාඩමාලාව අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩ දෙකකින් සමන්විත වේ.

(ii) නාවික අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (SET 1) හෝ අනිකුත් අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (SET 2) හෝ ක්ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා ඉල්ලුම් කළ හැක. ක්ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා අයදුම්කරන්නේ නම් ප්‍රමුඛතාවය සඳහන් කළ යුතුය.

(iii) නාවික අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩයේ දී, එනම් නාවුක ඉංජිනේරු තාක්‍ෂණය සහ නෞකා චලන අධ්‍යයන තාක්‍ෂණය (SET 1) සඳහා ප්‍රමුඛතාවය සඳහන් කිරීමේ දී වඩාත් කැමති ක්ෂේත්‍රය 01 ලෙස ද අනෙක් ක්ෂේත්‍රය 02 ලෙස ද සඳහන් කළ යුතුය.

(iv) අනිකුත් ක්ෂේත්‍ර කාණ්ඩය (SET 2) සඳහා ප්‍රමුඛතාවය 1, 2, 3, 4, 5, 6, 7, 8 සඳහන් කළ යුතු අතර වඩාත් කැමති ක්ෂේත්‍රය 01 ලෙස ද, රැළැග ක්ෂේත්‍රය 02 ලෙස ද අන්තිම ක්ෂේත්‍රය 08 ලෙස ද සඳහන් කළ යුතුය.

5. (i) *ඉල්ලුම් පත්‍ර ගාස්තු* :

ඉල්ලුම් පත්‍ර ගාස්තුවගයෙන් එක් ක්ෂේත්‍ර කාණ්ඩයක් සඳහා රු. 800.00 (අටසිය.යක්) හෝ ක්ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා නම් රු. 1000.00 (දාහක්) ගෙවිය යුතු අතර, එම වෙනම ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් "මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්‍ෂණික ආයතනය - ලංකා බැංකුවේ හෝම්ගම ශාඛාවේ ගිණුම් අංක 0000308280" දරන ගිණුමට බැර වන සේ ගෙවිය යුතුය. මෙම අයදුම්පත් ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

(ii) මුදල් ගෙවූ රිසිට්පතෙහි ඡායාව් කළ පිටපතක් මාර්ගගත අයදුම්පත්‍රය (online application) සමග යොමු කළ යුතු අතර රිසිට්පතෙහි මුල් පිටපත සමග අයදුම්පතෙහි මුද්‍රිත පිටපත එවිය යුතුය.

(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2021.09.17 වැනි දින වේ.

6. *යෝග්‍යතා පරීක්‍ෂණය හා ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතා පරීක්‍ෂණය* :

අයදුම්කරුවන් විසින් අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ලබාගත් ප්‍රතිඵල, කුසලතා පදනම මත හා එක් එක් දිස්ත්‍රික්කයට අදාළ ලකුණු සඳහා සිසුන් ප්‍රමාණය මත, මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්‍ෂණික ආයතනය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්‍ෂණය හා ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතා පරීක්‍ෂණය සඳහා කැඳවනු ලැබේ.

ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතා පරීක්‍ෂණයට අදාළ අධ්‍යයන ආධාරක සඳහන් http://www.itum.mrt.ac.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකිය.

7. *පාඩමාලාව සඳහා ලියාපදිංචි කිරීම* :

(i) යම් පාඩමාලාවක් සඳහා තෝරා ගන්නා ලද අපේක්ෂකයන්, පාඩමාලාව සඳහා ලියාපදිංචි කරනු ලබන දින, පහත සඳහන් සහතිකවල **මුල් පිටපත්** ඉදිපත් කළ යුතුය :

- අ. පො. ස. (උ. පෙළ) සහතිකය
- අ. පො. ස. (උ. පෙළ) Z ලකුණු සඳහන් සහතිකය
- පාසල් හැරයාමේ සහතිකය
- උප්පැන්න සහතිකය
- සහතිකපත්වල හා අදාළ ලියකියවිලිවල නමෙහි යම් වෙනස්කම් ඇත්නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක්.

8. *ඉතා වැදගත්* :

(i) ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමා පාඩමාලාව හැදෑරීම සඳහා ලියාපදිංචි වන කිසිම අපේක්ෂකයකු, එම පාඩමාලාවේ කාලසීමාව තුළ දී, මෙම විශ්වවිද්‍යාලයේ වෙනත් පාඩමාලාවක් හෝ ශ්‍රී ලංකාවේ පිහිටා ඇති අන් කිසිම විශ්වවිද්‍යාලයක පාඩමාලාවක් (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක පාඩමාලාවක් හැදෑරීමට සුදුසුකම් නොලබයි.

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති කිසිම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමා පාඩමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

(iii) අයදුම්පතුයේ සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි විය යුතු අතර යම් ලෙසකින් තොරතුරු අසත්‍ය බව හෙළිවුවහොත් ඒ සම්බන්ධව ආයතනය විසින් ගන්නා ඕනෑම තීරණයකට අයදුම්කරු එකඟ විය යුතුය.

අධ්‍යක්ෂ,
මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්‍ෂණික ආයතනය.

මොරටුව විශ්වවිද්‍යාලය,
මොරටුව.

08-138